**SPUR** (Society for Peace, Unity and Human Rights for Sri Lanka Inc

**Reg : A 003 0777 M**

**PO Box 4066, Mulgrave VIC 3170, Australia**

Phone / Fax : +61 03 9548 0276 email: ranjiths@spur.asn.au

---

26/08/2020 දින

අති පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල මහානායක හිමි,

ශ්‍යාමෝපාලි මහානිකාය, මල්වතු පාර්ශ්වය.

අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඥානරතන මහානායක හිමි,

ශ්‍යාමෝපාලි මහානිකාය, අස්ගිරි පාර්ශ්වය.

අතිපූජ්‍ය ත්‍රිකුණාමලේ ආනන්ද මහානායක හිමි,

ශ්‍රී අමරපුර ධර්මරක්ෂිත නිකාය.

පූජ්‍ය බෙන්ගමුවේ නාලක හිමි,

පූජ්‍ය මහාචාර්ය මැදගොඩ අබේතිස්ස හිමි,

පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි,

පූජ්‍ය උඩුදුම්බර කාශ්‍යප හිමි,

පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි,

පූජ්‍ය මහාචාර්ය ඉන්දුරාගරේ ධම්මරතන හිමි,

ගෞරවනීය ස්වාමීන්වහන්ස

## <u>නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක්</u>

### 16 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් මෙරට සිංහල රාජ්‍ය භාෂාව ඉවත් කර ඇත්තේ කෙසේද?

දැනට අවුරුදු විසිපහක පමණ කාලයක් ඕස්ට්‍රේලියාවේ සිට ශ්‍රී ලංකාවේ සාමය, ඒකීය භාවය සහ මානව අයිතීන් රැකීම උදෙසා කටයුතු කරනු ලබන, දේශප්‍රේමී ශ්‍රී ලාංකිකයින්ගෙන් සැදුම්ලත් 'ස්පර්' නමින් හදුන්වන අප සංවිධානය, මේ වනවිට උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන සිංහල ජනතාව මුහුණපා සිටින අසීරු තත්වයන් හා නිසි අවධානයකින් තොරව ඇතිකරන ලද අදූරදර්ශී ව්‍යවස්ථා සංශෝධන හේතුවෙන්

දිගුකාලීනව ඇති කර තිබෙන අනිසි ඵල විපාක, ගෞරවනීය ඔබ වහන්සේගේ අවධානය පිණිස මෙහි පහතින් සඳහන් කරනු කැමැත්තෙමු.

දේශපාලනඥයින්ද ඇතුළුව මෙරට දකුණේ ජීවත්වන ජනතාව විශ්වාස කරන්නේ 'සිංහල භාෂාව' රාජ්‍ය භාෂාව ලෙස සමස්ථ ශ්‍රී ලංකාව පුරා එකසේ ක්‍රියාත්මක වන බවයි. නමුත් උතුරු හා නැගෙනහිර වෙසෙන මුස්ලිම් හා දෙමළ දේශපාලනඥයින් එය එසේ නොවන බව දනී..

'සිංහල භාෂාව' රාජ්‍ය භාෂාව ලෙස පැවැතුනේ 1956 සිට 1988 දෙසැම්බර් 17 දක්වා වන 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාත්මක වූ වසර 31 දක්වා කාලය තුළ පමණි.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව වගන්ති 5.8(1) 1958 අංක 28 දරණ රාජ්‍ය භාෂා විශේෂ විධිවිධාන පනත යටතේ දෙමළ භාෂාව භාවිතා කිරීමේ සාධාරණ අවස්ථාවක් දෙමළ භාෂාව කතාකරන ජනතාවට හිමිකරදී තිබුණි. නමුත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සිංහල රාජ්‍ය භාෂාව වශයෙන් තබාගෙනම සිංහල හා දෙමළ භාෂාවන් දෙකම ජාතික භාෂාවන් බවට පත්කරන ලදි.

1978 ව්‍යවස්ථාවේ (වගන්ති 18, 19) යටතේ සිංහල රාජ්‍ය භාෂාව ලෙසත්, සිංහල හා දෙමළ භාෂා දෙකම ජාතික භාෂාවන් ලෙසත් සඳහන් වුවද, වගන්ති 22(1) හා 24(1) මගින් පහත සඳහන් කරුණු මෙලෙස සහතික කර තිබිණ..
(අ) සිංහල ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව වනු ඇත;
(ආ) රාජ්‍ය භාෂාව සමස්ථ ශ්‍රී ලංකාවේම පරිපාලන භාෂාව වේ;
(ඇ) ලංකාවේ අධිකරණ භාෂාව රාජ්‍ය භාෂාව වන සිංහලෙන් විය යුතුය.

1987 දී පළාත් සභා පිහිටුවීමේදී සිදුකල 13 වෙනි ව්‍යවස්ථා සංශෝධනයේ වගන්ති 18(2) අනුව දෙමළ භාෂාවද රාජ්‍ය භාෂාවක් කර, වගන්ති 18(3) අනුව ඉංග්‍රීසි භාෂාව සම්බන්ධීකරණ භාෂාව කලද, ව්‍යවස්ථාවේ වූ අනෙකුත් වගන්ති මගින් දිවයින පුරා රාජ්‍ය භාෂාව ලෙස සිංහල භාෂාවට එතෙක් හිමිව තිබූ තැනෙහි පහත වැටීමක් සිදුනොවී තිබිණ.

කෙසේ නමුත් 80 දශකයේ අග භාගයේ, අතුරුදහන් කිරීම්, පැහැරගෙනයාම්, මිනී මැරුම් බහුලව පැවති සුප්‍රකට "භීෂණ" සමයෙහි පැවැත්වූ ජනාධිපතිවරණයට දින දෙකක් තිබියදී, 1988 දෙසැම්බර් මාසයේ දී, සම්මත කරගත් 16 වැනි ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධන මගින් ලංකාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගේ තත්වය මුළුමණින්ම උඩු යටිකුරු කරවන ලදි.

16වන සංශෝධනය මගින්, එතෙක් 1978 ව්‍යවස්ථාවේ සඳහන් වූ;

අ) පරිපාලන භාෂාව පිළිබඳ වූ වගන්ති 22(1), 22(2) සහ 22(3) අවලංගු කොට අළුතින් වගන්ති 22(1) – 22(4) ආදේශ කරන ලදි.

ආ) ව්‍යවස්ථාදායකයේ භාෂාව පිළිබඳ වූ වගන්ති 23 අවලංගු කොට අළුතින් වගන්ති 23(1) – 23(3) ආදේශ කර ඇත.

ඇ) අධිකරණයේ භාෂාව පිළිබඳ වූ වගන්තිය 24(1) අවලංගු කොට අළුතින් වගන්තියක් ආදේශ කර ඇත.

ඈ) රාජ්‍ය සේවාවට ඇතුළත්වීමේ භාෂාව පිළිබඳව වූ වගන්තිය 25(5) අවලංගු කොට අළුතින් වගන්තියක් ආදේශ කර ඇත.

**16 වැනි ව්‍යවස්ථා සංශෝධන මගින් ඇතිකරන ලද උක්ත වෙනස්කම් හේතුකොට ගෙන,**

1. **සිංහල භාෂාව දිවයින පුරා තව දුරටත් රාජ්‍ය භාෂාව හෝ පරිපාලන භාෂාව වශයෙන් නොසැලකේ.**

II. සිංහල භාෂාව පරිපාලන භාෂාව ලෙස ක්‍රියාත්මක වන්නේ දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත් හැර ඉතිරි පළාත් හත තුළ පමණි.

III. සිංහල භාෂාව පිළිබඳව එවැනි සීමාවන් පැනවී තිබුණද, දිවයිනේ අනෙකුත් පළාත්වල පරිපාලන භාෂාව ලෙස දෙමළ භාෂාව භාවිතා කිරීම පිළිබඳව එවැනි සීමාවන් නොමැත.

IV. වගන්ති 22(1) අනුව භාෂාමය සුළුතරයක් වෙසෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල එවැනි සුළුතරයකයේ අවශ්‍යතා වලට අනුව භාෂාමය ඒකකයක් පිහිටුවා, සිංහල සහ දෙමළ හෝ <u>අදාල පළාතේ පරිපාලන භාෂාව නොවන වෙනත් භාෂාවක්</u> එම ඒකක තුල පරිපාලන භාෂා ව කරලීමට ජනාධිපතිවරයාට බලය පවතී.

ඉහත (ඈ) හා වගන්ති 22(5) අනුව ඇතිකරන ලද වෙනස්කම් අනුව උතුරු හා නැගෙනහිර පළාත්වල සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන් සිංහල භාෂා ප්‍රවීණතාවයක් ලබා ගැනීම අවශ්‍ය නොවේ. ඔහු ලබා ඇති දෙමළ භාෂා දැණුම ඔහුගේ රාජකාරිය ඉටු කිරීමට ප්‍රමාණවත් වන බැවිනි.

ජාතික භාෂාවන් භාවිතා කිරීම හා අදාල වගන්ති  තුලට ඉංග්‍රීසි භාෂාව ප්‍රතිස්ථාපනය කිරීම මගින් ඉංග්‍රීසි, සම්බන්ධීකරණ භාෂාව මට්ටමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව හෝ අඩුම වශයෙන් ජාතික භාෂා මට්ටමට නංවා තිබේ.

ඉහත (ii) අනුව උතුරු හා නැගෙනහිර පළාත්වල, සිංහල පරිපාලන භාෂාවක් නොවීමෙන්, එම පළාත්හි වෙසෙන දස දහස් ගණනක් සිංහල කථා කරන වැසියනට එම ප්‍රදේශයන්හි රජයේ සහ පළාත් පාලන ආයතන සමග ලිපි හුවමාරු කරගැනීමේදී තම මව් භාෂාව වෙනුවට තමනට නුහුරු දෙමළ භාෂාවෙන් කරගැනීමට බලකිරීමෙන් මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුව තිබේ.

ඉහත (iv) හා වගන්ති 22(1) අනුව සුළුතර භාෂාමය ඒකකයන් පිහිටුවීමට හැකිව තිබීම, වාර්ගික සහ ආගමික දේශපාලනයේ යෙදී සිටින සුළුතර පක්ෂ,  තම ජාතිවාදී අරමුණු ඉටුකර ගැනීමෙහිලා,  දකුණේ ඇතැම් බල ලෝභී දේශපාලකයින් සමග කේවල් කිරීමට යොදවා ගත හැකිවීමේ අවදානම සුලු පටු නොවේ.

එබැවින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේදී  ඉහත දැක්වූ කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු බැව් අපගේ හැඟීම වේ.

ආචාර්ය දසරත් ජයසූරිය

සභාපති, ස්පර් සංවිධානය, ඕස්ට්‍රේලියාව

පිටපත්: අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා

අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා

ගරු  අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා

ගරු  අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමා

ගරු  අමාත්‍ය  උදය ගම්මන්පිල මැතිතුමා

ගරු  රාජ්‍ය අමාත්‍ය රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර මැතිතුමා

ගරු  රාජ්‍ය අමාත්‍ය  මහාචාර්ය චන්න ජයසුමන මැතිතුමා

ගරු  රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමා

ගරු රාජ්‍ය අමාත්‍ය  වෛද්‍ය සීතා අරඹේපොල මැතිනිය

ගරු රාජ්‍ය අමාත්‍ය  ආචාර්ය අජිත් කබ්රාල් මැතිතුමා

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග මැතිතුමා

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අනුප පැස්කුවල් මැතිතුමා

ආචාර්ය  ගුණදාස අමරසේකර මැතිතුමා

අනිල් අමරසේකර මැතිතුමා,  ජාතික ඒකාබද්ධ කමිටුව